# ධනපති ක්‍රමයට කඩේ යන ජවිපෙ යුධවාදී, ප්‍රතිගාමී ස්ථාවරය

අදත් ජනතා විමුක්ති පෙරමුණේ අලුත් දර්ශනයක් ඉදිරිපත් කරල තියෙනව. දේශප්‍රේමී අරගලයට විරුද්ධ වෙන්නේ දෙමළ කොටි විතරක් නෙමෙයිලු. රජයේ ඉහළ තැන්වල ඉඳගෙන රජයේ සල්ලි ගසා කන දූෂිතයන් දෙමළ කොටින්ත්ට වඩා බියකරුයිලු. මොකද? මේ දූෂිත නඩය හමුදාව ගෙන යන දේශප්‍රේමී සටන අමුඅමුවේ බකල් කරනවලු, පාවා දෙනවලු. එනිසා ප්‍රධාන සටන නැත්නම් මුල් සටන කළ යුත්තේ මේ හොර කොටින්ට විරුද්ධවයි. පළමුව හොර කොටි, දෙවනුව දෙමළ කොටි කියන සටන්පාඨය දැන් අලුත්ම සටන්පාඨය වෙලා.

මේ අනුව තමයි දැන් මහින්ද රජයට විරුද්ධව හැම පැත්තකින්ම බැට දෙන්න උන්නැහේලා පටන් අරන් තියෙන්නේ. හුහ දෙනෙක් විමල්ගෙන් ඇහැව්වා, ඇයි බජට් එකට විරුද්ධව ඡන්දේ දීලා ආණ්ඩුවට විරුද්ධ වෙන්න හදන්නේ කියලා. ඒකට තමා මේ පිළිතුර දීලා තියෙන්නේ.

හොර කොටි, පාලනයේ ඉන්නකම් දේශහිතෛෂී සටන අඩාලයි. එනිසා පළමුව හොර කොටින්ට, දෙවනුව දෙමළ කොටින්ට කියලා දැන් ඔවුන් එළිපිටම කියනව. දැන් මේ හොර කොටි නඩයට මහින්දත් ඉන්නවද? මේකට නම් තවම විවෘත පිළිතුරක් මේ අයගෙන් ලැබිල නෑ, ඒත් ගෝඨාභය, බැසිල් වගේ අය ඉන්න බව අනියම් ලෙසටවත් කියැවෙනව.

එහෙම නම් මේ ආණ්ඩුව ඉවත් කරල හොර නැති ශ්‍රීලනිපයේ නායකයෙක් හෝ අල්ලගෙන ආණ්ඩුවක් හදන්න ජනතා විමුක්ති පෙරමුණ දඟලනවා වෙන්න පුළුවන්. මොකද? එක්සත් ජාතික පක්ෂය කියනව ඒ ඇත්තෝ ආණ්ඩුව වැට්ටුවත් පාර්ලිමේන්තුව විසිරුවලා ඡන්දයක් නැතිව අලුත් ආණ්ඩුවක් හදන්නේ නැතිලු. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් දි.මු ජයරත්න උන්නැහේ ඉස්සරහට දමල ආණ්ඩුවක් හදන්න පුළුවන්කම ලැබෙනව.

ජනතා විමුක්ති පෙරමුණට අනුව කොටි සංවිධානය ඇමරිකන් අධිරාජ්‍යවාදීන් විසින් ගෙන යන, නඩත්තු කරන බලයක්. එයට දෙමළ ජනතාවගේ ඇත්ත සහයෝගයක් නෑ. ඒ අනුව ක්‍රිස්ටිනා රොකාට සෝමවංශ ලියූ ලිපියේ ඉදළම ඔවුන් ඇමරිකාවෙන් ඉල්ලන්නේ මේ බිහිසුණු කොටි සංවිධානයට විරුද්ධව උදව් කරන ලෙසටයි. දැන් ප්‍රශ්නයක් මතුවෙනව.

## ප්‍රශ්නය

කොටි සංවිධානය ඔය කියන විදියට ඇමරිකන් වැඩක් නම් එයට විරුද්ධ සටනට ඇමරිකන් කාරයන්ගෙන්ම සහය ඉල්ලන එක හරිද කියලා. සෝමවංශ, වීරවංශට මේ පරස්පරය පෙනෙන්නේ නෑ. එක අතකින් කෑ කහනව ඇමරිකන් පිල්ලුවක් තමා කොටි සංවිධානය කියලා. අනෙක් අතට ඇමරිකන් රාජ්‍ය සහකාර ලේකම් ක්‍රිස්ටිනා රොකාට ලියනව කොටි විරුද්ධ සටනට සහයෝගය දෙන්න කියලා. 2005 අප්‍රේල් 20 වැනිදා සෝමවංශ නායකතුමා ලිපියෙන් ඉතා බැගෑපත් ලෙසට ඉල්ලුවේ,

1. කොටි සංවිධානය සුනාමි සහන වැඩපිළිවෙලට එකතු කරගන්න එපා. ආණ්ඩු යන්ත්‍රය පමණක් ප්‍රමාණවත් බව පිළිගන්න.

2. කොටි ඒකාධිපතිත්වයට විරුද්ධව සිටින උතුරු-නැගෙනහිර දේශපාලන නායකයින් පිළිගන්න.

3. ප්‍රභාකරන් නමැති හිට්ලර්ට සහ ඔහුගේ සගයින්ට විරුද්ධව වහාම නීතිමය පියවර ගන්න.

4. ප්‍රජාතන්ත්‍රවාදය, විනිවිද දැක්ම, මානව හිමිකම් වෙනුවෙන් ඔබගේ කැපවීම තදින්ම ගෙන යන්න.

ඒ විතරක් නෙවෙයි, ඒ ලිපියේ සඳහන් කළේ තමන් ඇමරිකාවේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුව ගැන විශ්වාස කරන බවයි. මේ විදියට ඇමරිකන් පාලනයට සුදු හුණු ගාමින් ඔවුන්ගේ පිහිට ඉල්ලුවේ කොටි සංවිධානයට විරුද්ධව ක්‍රියා කිරීමටයි.

## දෙබිඩි පිළිවෙත

ඒත් අනෙක් අතට සිංහල ජනතාව අමතමින් වීරවංශ දේශනා කරන්නේ කොටි සංවිධානය ඇමරිකන් හා ගෝලීය ධනවාදයෙන් නඩත්තු කරන සංවිධානයක් බවයි. දැන් තව පැත්තකට හැරිල ආණ්ඩුව හොර කොටි සංවිධානයක් නිසා දෙමළ කොටින්ට පෙර මේ හොර කොටින්ට විරුද්ධව ක්‍රියා කළ යුතු බව කියනව.

සෙබළුන් වීරයින් ලෙස සටන් කරද්දී ඉහළ සිටින ආණ්ඩුවේ දේශපාලන බලවතුන් අමුඅමුවේ හොරකම් කරමින් පිස්සු කොළින බව දැන් මේ නායකයෝ කියන්න පටන් අරන්. ඒත් දැන් ආණ්ඩුව පැහැදිලිවම යුදවාදීව ක්‍රියා කරනව. යුද්ධයක් තුළ හොරකම් ඇති වීම ලෝකය පුරා පෙනෙන දෙයක්. තමන්ට ලැබෙන මිලිටරි බලය අයුතු ලෙස යෙදීම යුධ නායකයින් අතර වෙන දෙයක්.

<u>සාධාරණ යුද්ධය</u>

විශේෂයෙන්ම ධනපති සූරාකන සමාජයක යුද්ධය මේ වගේ විනාශකාරී ලෙසට ගොඩනැගීම වෙනස් කරන්න බෑ. එනිසා තමයි යුද්ධයෙන් ප්‍රශ්න විසඳන්න බෑ කියන මතය ගොඩනැගෙන්නේ.

මේ යුගයේ තිබෙන්න පුළුවන් එකම සාධාරණ යුද්ධය සූරාකෑමට විරුද්ධව දියත් වන පංති යුද්ධය පමණයි. ධනපති සමාජය තුළ පවතින ජාතික හා ජාතිවාදී නායකයින් අතර ගැටුම් ඉතාම දූෂිත, පසුගාමී තත්වයට පත් වෙනවා. එනිසා කිසිම විප්ලවවාදියෙකුට මේ යුද්ධවලට සහය දෙන්නට පුළුවන්කමක් නෑ.

දැන් ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවෙන් ඈත්වීමට යොදාගත් ප්‍රයෝගයක් හැටියට මේ හොර කොටි කථාව හඳුන්වන්න පුළුවන්. පහළින් නැග එන පංති උද්ඝෝෂණ නිසා ඒවා සමඟින් ගමන් කිරීමට දෙපිටකාට්ටු කථාවක් විමල්ලා ගොතාගෙන තියෙනව. ඒත් තම යුධවාදී, ප්‍රතිගාමී ස්ථාවරයන් අත්හැරලා නෑ. ආණ්ඩුව තුළත්, හමුදා නිළධාරීන් තුළත් ඉන්න තම සහචරයින්ට ගැලපෙන දෙපිටකාට්ටු කථාවක් මේ එළියට දමලා තියෙන්නේ. කොච්චර කල් මේ දේශපාලන ප්‍රෝඩාවල් ගෙනියන්න මේ නායකයෝ බලාපොරොත්තු වෙනවද?